


දක්ෂ ගොවියෝ

# නිසරු කෙතක් සරු කෙතක් කළ ආදශීවත් ගොවියා

අනාදීමත් කාලයක සිට මැණික් ගැන විශාල කීර්තියක් උසුලන රත්නපුරා නගරයට සැතපුම් දහසයක් මොබ්බෙහි පනාවල් කෝරළයට අයත් පරකඩුව අසල බේන්දළුව නමැති කුඩා ගමක් ඇත. මේ ගමෙහි වෙසෙන ගැමියන් බොහෝ දෙනෙක් කුඹුරු ගොවිතැනෙන් ම යැපෙති. දිවයිනේ වෂීා කලාපයේ 'ගැටළු ප්‍රදේශයෙහි' පොදුවේ දක්නට ලැබෙන කිවුල් පසින් යුත් මෙහි කුඹුරු ඉතාමත් නිසරුය. වී ගොවිතැන පිළිබඳව දිවයිනේ පෙරමුණ ගන්නා කෑගලු දිස්ත්‍රික්කයට අයත් වුවද බේන්දළුවේ කුඹුරු අක්කරයකින්



ඔහුගේ බිරිඳ කිරි දෙවයි

ලැබෙන අස්වැන්න ප්‍රමාණය බුසල් 10-18 කට වැඩි නොවේ. ගොවිකම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පිළිපැද නවීන ගොවිතැන් ක්‍රම අනුගමනයෙන් මේ නිසරු පෙදෙසෙහි විශිෂ්ට වාර්තාවක් පිහිටවූ ශූර ගොවියෙකු අපේ පාඨකයන් වෙත මෙද ඉදිරිපත් කිරීමට ලැබීම ගැන අපි ප්‍රීතිවෙමු.

කෑගල්ල, රුවන්වැල්ල, කරවනැල්ල යන නගර හා ඒ අවටවූ ගම් නියම්ගම් පසුකොට කොළඹ රත්නපුරා පාරේ හතළිස් නවවැනි සැතපුම අසළවූ බෙන්දළුවට අප ළඟාවන විට අපේ ශූර ගොවියා සිය කණිටු පුත් ජයරත්නත් සමග කුඹුරක් සාමින් සිටියේය. මොහොතකින් මඩ සෝදාගෙන ගොඩට පැමිණි පිය පුත් දෙදෙනා අප කැටුව ගියේ ඔවුන්ගේ කුඩා නිවස කරාය. ආගිය තොරතුරු විමසීමෙන් පසුව හේ සිය ජීවිත කථාව අපට විස්තර කෙළේ උග්‍ර සටනකින් ජයගත් වීර සෙබළෙකු විලාසයෙනි. ගොවිතැනින්ම යැපී, ගොවි තැනින්ම හැදී වැඩුනු ගොවියෙකුට දැව සේනානායක මුදියන්සේලාගේ මර්තේලිස් අප්පුහාමි මෙලොව එළිය දුටුවේ 1915 අවුරුද්දේදීය. සිංහල-මුස්ලිම් කෝලාහලය පැතිර ගිය අන්ධකාර සමයේ මෙලොව එළිය දුටුවද මර්තෙලිස් අප්පුහාමි හැදී වැඩුනේ ගම්බද සාමකාමී නිශංසල පරිසරයකය. පස් හැවිරිදි වත්ම හේ ගමේ අනිත් ළමුන් සමඟ පාසැල් ගියේය. එහෙත් හෙතෙම උගෙනීම ලැබුවේ සතරවැනි පන්තිය දක්වා පමණකි. ඔහු පාසැල් යෑම අත්හළේ උගෙනීමට ඇති අඩු ඇල්මක් නිසා හෝ ගොවිකමට ඇති වැඩි ඇල්මක් නිසා හෝ නොවේ; පවුලේ අගහිඟකම්වලින් පොළඹවනු ලැබූ නිසාය. පවුලේ නඩත්තුව සඳහා සිය පියාගේ ගොවිතැන් කටයුතුවලට තම මුලු කාලයම යෙදවීමට සිදුවූ නිසාය. මරේත්ලිස් අප්පුහාමි තමාට පැවැරුණු අලුත් වගකීම සපුරා ඉටුකරලීම සඳහා හැම උත්සාහයක්ම දැරීය. කුඹුරු වැඩ කාලයේදී කුඹුරු වැඩටත්, ගොඩ ගොවිතැන්




මර්තේලිස් අප්පුහාමි සිය කුඹුරේදී

කාලයේදී ගොඩ ගොවිතැනටත් සිය පියාට උදව්දුන් අතර විවේක කාලයේදී පතල් වැඩට ගියේය. මැණික් පතල්වල වැඩ කිරීමෙන් ඔහුට දිනපතා වැටුපක් ලැබුනද ඉක්මණින් ලක්ෂපතියෙකුවීමේ භාග්‍යය නම් නොලැබුනේය. මැණික් ගැරීමෙන් ඉක්මණින් පෝසතෙකු වීමේ බලාපොරොත්තුවක් එදා මෙන්ම අදත් ඔහු වෙත නැත්තේය. ගොවිතැනින් ලැබෙන ආදායමෙන් සිය පවුළ නඩත්තු කොට ප්‍රීතියෙන් ජීවත් විය හැකි නම් ඉන් හෝ සෑහීමකට පත් වන්නේය.

තම මවගෙන් තමන්ට උරුමවූ කුඹුරුවල හෙතෙම වී වගා කරන්නේය. මීට අතිරේක වශයෙන් අඳේට ලබාගත් කුඹුරුද වැඩ කරන්නේය. එහෙත් ගතානුගතික ක්‍රම අනුගමනයෙන් ඔහුට ලැබුනු අස්වැන්න ප්‍රමාණය පවුලේ නඩත්තුවට වුවද ප්‍රමාණවත් නොවීය. 1947 අවුරුද්දේදී ඔහුගේ භාග්‍යය උදා වූයේය. ගොවිකම් දෙපාතීමේන්තුවේ නිලධාරී මහතුන් කිට්ටුවෙන් ආශ්‍රය කරන්නට ලැබුනෙන් ඒ මහතුන්ගේ උපදෙස් පරිදි කුඹුරු ගොවිතැන විධිමත්ව පටන්ගත්තේ එවක් සිටය. පළමුවෙන්ම හෙතෙම වැඩෙන ගොයම හැමෙන් වල් පැළෑටි මර්දනය කෙළේය. ඉන්පසු එම ගොයමට පෝර ඉස වෙනදට වඩා උසස් අස්වැන්නක් ලබා ගත්තේය. ඊළඟ මෝසමේ සිට පැළ සිටුවීමටද පටන් ගත්තේය. එයින්ද යහපත් ප්‍රතිඵල ලැබුනෙන් හෙතෙම තව තවත් නවීන ගොවිතැන් ක්‍රම කෙරෙහි සිත යොමු කළේය.

1957 මාස් මෝසමේදී පළාතේ ගොවිකම් ඕවර්සියර් මහතාගේ ද සහාය ඇතිවැ ජපන් ක්‍රමය අනුව වී වගා කෙළේය. පොඩි වී ඒ8 ආරයේ නුමුහුන් බිත්තර වියද මේ සඳහා යොදා ගන්නා ලදී. ජපන් ක්‍රමය අනුව පැළ ගොයම සිටුවා ඉන් දෙසතියකට පසු ගොවිකම් දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කරන ලද යූරියා සහිත පෝර මිශ්‍රණයද යෙදවිණි. ගොයම පීදීමට දින 30 කට පෙර නැවතත් අක්කරයකට යූරියා රාත්තල් 44 බැගින්



**සිය සගයන් සමග**

යොදන ලදී. ගොයම මනාව පැසුණු පසු පලාතේ පාර්ලිමේන්තු මන්ත්‍රිනි කුසුමා ගුණවර්ධන මැතිණියගේ ප්‍රධානත්වයෙන් අස්වැන්න ගණන් ගැනීමේ පරීක්ෂණයක්ද පැවැත්විණි. එම මූලික පරීක්ෂණයේදී කුඹුරු යායෙන් සාමාන්‍ය අක්කරයකින් බුසල් 65 ක අස්වැන්නක් ලැබෙන බව පෙනීගිය අතර කුඹුරෙහි මුලුමනින්ම ගොයම කපා අස්වැන්න රැස්කරගත් විට අක්කරයකින් බුසල් 96ක අස්වැන්නක් ලැබී තිබෙන බව පෙනී ගියේය. මේ වූකලී ප්‍රදේශයේ නිසරු කුඹුරකින් ලැබුනු උසස්තම අස්වැන්නකි. මෙතෙක් පනාවල් කෝරළයේ වී අස්වැන්න පිළිබඳව පිහිටුවා වූ උසස්තම වාර්තාවය. මුලදී අක්කරයකින් බුසල් 10ක අස්වැන්නක් ලැබුනු කුඹුරකින් එමෙන් නව ගුණයකටත් අධික අස්වැන්නක් ලැබුනේ **නවීන ගොවිතැනේ මහිමයෙනි. පෝර යෙදීමේ අනුහසිනි.** මේ රටේ නිෂ්පාදන වේගය වැඩිකොට රට ස්වයංපෝෂිත කිරීමේ පරම බලාපොරොත්තුව මුදුන් පමුණුවා ගැනීමේ ඒකායන මාර්ගය එයයි.

මර්තේලිස් අප්පුහාමි මහතාගේ නිවස නවීන මන්දිරයක් තරම් විශාල නොවෙතුදු, කුඩා පැල්පතක් තරමට කුඩා නොවෙතුදු එහි වාසනාව නම් පිරී ඉතිරී ගිය බැව් පෙනීගියේ, ගෙයි මිදුලේ සෙල්ලම් කරමින් සිටි කුඩා ළපටි යන්ගේ සිනහමුසු, සිනහබර මුහුණු දෙස බැලීමෙනි. ඇතැම් විශාල මන්දිරයක දකින්නට නොලැබෙන ප්‍රීතියත්, වාසනාවත්, මෙ වැනි 'පිටිසර ගෙදරක දක්නට ලැබෙන්නේ සිරිකත පිටිසර වාසයට වැඩි රුචියක් දක්වන නිසාදෝහෝ'යි නොදනිමු.


මර්තේලිස් අප්පු මහතා දරුවන් හය දෙනකුගේ වාසනාවන්ත පියෙකි. ඇතමෙකුට දරුවන් හය දෙනෙකු මහත් බරක් මෙන් දැනුුදද, අපේ මේ ශූර ගොවියාට එය මහත් සම්පතකි. සිය දරුවන්ටද කුඩා කල සිටම ගොවිතැන හුරු පුරුදු කිරීමට මේ ආදර්ශවත් පියා අමතක නොකරයි. අනාගත ලංකාව ස්වයංපෝෂිත කිරීමට නම් වත්මන් බාල

පරම්පරාව ගොවිතැනට ඇබ්බැහි කළ යුතුය යනු මර්තේලිස් අප්පුහාමි මහතාගේ ඒකාන්ත විශ්වාසයයි.

අප මුන ගැසෙන විටත් මර්තේලිස් අප්පුහාමි මහතා සිය කුඹුර හාමින් සිටියේ තම දස හැවිරිදි පුත් ජයරත්නත් සමගය. මේ දස හැවිරිදි දරුවා ගොවිතැන ගැන දක්වන උද්‍යෝගය දෙස බලා සිටින්නෙකුට ඔහු අනාගතයේදී දක්ෂ ගොවියෙකු වන බවට අනාවැකියක් පළකිරීම එතරම් දුෂ්කර කාර්‍යයක් නොවේ. හැදෙන ගස දෙපැත්තෙන් දැනීම අරුමයෙක් ද?

මර්තේලිස් අප්පුහාමි මහතාගේ ගෙවත්ත අක්කරයක් පමණ ඇත. ගෙයි පසු බිමෙහි වූ ඉඩම තද බෑවුම් සහිතය. එහි ගල්වැටි දමා පස් සංරක්ෂක කටයුතු යොදා ඇත. ගෙවත්තෙහි කෙසෙල්, පුවක්, කොස් දෙල් වැනි මිශ්‍ර බෝගයන් වගාකොට ඇත. ගල් සහිත බිමේ අතරින් පතර අන්නාසි පඳුරුය. ගෙය අසලම කුඩා එළවළු කොටුවකි. කිරි එළදෙනෙකු ඇති කිරීමටද ඔහු අමතක කොට නැත්තේය.

මර්තේලිස් අප්පුහාමි මහතා මුලු පනාවල් කෝරළයටම ආඩම්බරයකි. එහි වෙසෙන සෙසු ගොවි මහතුන් ද ඔහුගේ ආදර්ශය අනුගමනය කළහොත් මෙතෙක් දිවයිනේ ගැටළු ප්‍රදේශයක් වශයෙන් හඳුන්වුනු පනාවල් කෝරළය අනාගතයේදී දිවයිනේ ආදර්ශීමත් ගොවිබිමක් වනු නිසැකය.



ආදර්ශවත් ගොවියා සිය සිහිනි දරුවන් සමඟ